**පදවිය ප්‍රාදේශීය සභාව - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පදවිය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පදවිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේදී රු.548,986 කට මිලදීගත් ප්‍රියෙස්ට්‍රා ඇඳි සහිත කුෂන් පුටු 96 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේදීද නැවත ගිණුම්ගත කිරීම නිසා ස්ථාවර වත්කම් රු.548,986 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ස්ථාවර වත්කම් වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | වත්කම් 03 කට අදාල සමාලෝචිත වර්ෂයේ එකතු කිරීම් රු.3,034,414 ක් වෙනුවෙන් ක්ෂය කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂය හා ක්ෂය වෙන්කිරීම් රු.317,165 ක් වැඩියෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සහ වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | සහතික කළ බිල්පත් අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාර්ග 03 ක වටිනාකම රු.4,295,181 ක් වුවත් එය රු.3,838,648 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන ප්‍රදාන රු.456,533 ක් අඩුවෙන් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් රු.313,893 ක් වුවත් එය රු.562,822 ක් ලෙස රු.251,929 ක් වැඩියෙන් සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | ඉකුත් වර්ෂයේ වත්කම් වැරදි ලෙස ප්‍රාග්ධනිත කිරීම නිවැරදි නොකිරීම හා අතිරික්තයේ (ඌණතාවය) හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ආරම්භක ශේෂය සමුච්චිත අරමුදලෙහි දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ශේෂය රු.1,515,378 ක් වැඩියෙන් ශුද්ධ වත්කම් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගැලපුම් යටතේ ආදායම් ප්‍රකාශයේ වෙනස ලෙස හඳුනාගත් ආදායම් රු.9,023,017 ක් වැරදි ලෙස ගැලපීම් කර තිබුණි. | නිවැරදි කර ඉදිරියේදී ඉදිරිපත් කරමි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම නිර්දේශය | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් සහ වගකීම් ප්‍රකාශය අනුව ශුද්ධ වත්කම් රු.367,860,684 ක් වුවත් ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීම ප්‍රකාශය අනුව එය රු.362,238,089 ක් වුයෙන් රු.5,622,595 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතු වේ |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.228,690,000 ක්වූ ඉඩම් අක්කර 143.75 කට අදාළ පැවරුම් ඉල්ලීම්, ඉඩම් මැනීම් වාර්තා සහ පැවරුම් ඔප්පු ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් කිහිප අවස්ථාවකම ප්‍රාදේශීය ලේකම් වෙත බලප්‍රදේශයේ ඉඩම් මැන අදාල කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලීම් කළ නමුදු මේ වන විටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් එම කටයුතු සිදු කර නොමැත. | පැවරුම් ඔප්පු ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | සභාව සතු වාහන 07 ක ඉන්ධන දහනය පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | ප්‍රාදේශීය සභාව සතු අරමුදල් ප්‍රමාණවත් නොවීම මත 2021 වර්ෂයේ ඉන්ධන පරීක්ෂාව වාහන 07 ක් සඳහා සිදු කිරීමට නොහැකි වු අතර මෙම වර්ෂයේදී ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට බලාපොරොත්තු වෙමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයභාරය ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,596,089 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්මවූ පුනරාවර්තන වියදම රු.777,540 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 අගෝස්තු 16 දින ගිනි ගැනීමට ලක්වීම නිසා පිළිසරු ඒකකයේ සවිකර තිබුණු බේල් කිරීමේ යන්ත්‍රය සිදුවූ රු.800,000 ක අලාභය සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීමට මු.රෙ. 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විමර්ෂණ කටයුතු සඳහා නිලධාරියෙක් පත් කර ඇත. | මු.රෙ. 104 ප්‍රකාරව වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වේ. |
| (ආ) | 2021 වර්ෂයේ කර්මාන්ත ණයගැති ශේෂය තුළ පවතින වසර 02 ත් 06 ත් අතර කාලයක සිට අයනොවූ රු.3,757,053 ක ශේෂයක් පිළිබඳ පරීක්ෂාකර අයකර ගැනීම කටයුතු කර නොතිබුණි. | ආදායමට ගෙන ඇත්දැයි තහවුරුවක් ලබාගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරමි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | 2021 වර්ෂයේ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ පවතින වසර 02 ත් 06 ත් අතර කාලයක සිට නිරවුල් කළයුතුව පවතින රු.3,776,712 ක ශේෂයක් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කර ඇත්දැයි තහවුරුවක් ලබාගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරමි. | ණයහිමි ශේෂය හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් වටිනාකම රු. 3,991,950 ක් වූ වත්කම් 08 ක් වසර 03 ත් වසර 06 ත් අතර කාල පරාසයක සිට නිශ්කාර්යව පැවතුණි. | ඉංජිනේරු නිර්දේශ ලැබුණු පසු වෙන්දෙසි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. | ප්‍රයෝජනයට ගැනීමට හෝ විධිමත් පරිදි වෙන්දේසි කිරීමට හෝ ක්‍රියාකළ යුතුවේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් භාවිතා කරනු ලබන නමුත් සභාවට අයත් නොවූ රු.22,150,000 ක පිරිවැය වූ වාහන 08 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | වාහන වල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය පාර්ශවයන් ලිඛිතව දැනුවත් කර තිබුණද මේ වන තෙක් පවරා දීමට අවශ්‍ය කටයුතු සිදුකර නොමැත. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. |

**3.4 ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භ කර නිමකිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණු ගිවිසුම්ගත වටිනාකම රු.28,860,909 ක්වූ කුට්ටිගල් ව්‍යාපෘති 16 ක් අත්හැර දමා තිබුණි. | මෙම ව්‍යාපෘති භාර ගැනීමට කොන්ත්‍රාත් කරුවන් ඉදිරිපත් නොවීම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. | ගිවිසුම්ගත ව්‍යාපෘති අවසන් කර ගැනීමට අවධානය යොමුකළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ නිමකළයුතු ඇස්තමේන්තු පිරිවැය රු.1,967,544 ක්වූ ව්‍යාපෘති 02 ක් සඳහා එදිනට රු.438,853 ක් වියදම් කර තිබුණු නමුත් වැඩ නිමකර නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට වැඩ නිමකර නොතිබු නමුත් මේ වන විට වැඩ අවසන් කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව වැඩ නිමකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |